# භාෂණ පරිවර්තක සේවා

ඔබ හා සම්බන්ධවීමේදී ඔබට තේරෙන භාෂාවකින් කතාකරන බවත් උපරිම විශ්වාසයක් ඇති  බවත් භාෂාව පහසුවෙන් පාවිච්චි කළහැකි බවත් සහතිකවීම අපට අවශ්‍යය. පහත දැක්වෙන අවස්ථාවලදී වෘත්තීය භාෂණ පරිවර්තකයකු ඉල්ලා සිටීමට ඔබට අයිතියක් ඇත ෳ

- ඔබ නිවසේදී ඉංග්‍රිසි භාෂාව කතා නොකරන්නේ නම් හෝ ඔබේ පළමු භාෂාව ඉංග්‍රිසි නොවේනම්
- අප ඔබට කියන සියළුම දේ ඔබට නොතේරෙයි නම්
- සමහර අවස්ථාවල ,වෙනත් භාෂාවකින් සම්බන්ධීකරණය වීම පහසුය.
- ඔබට  අත්සන් කිරීමට ඇති දෑ මුළුමනින්ම නොතේරෙයි නම්
- ඔබ  කතාකරන භාෂාවෙන් පරිවර්තනය කර ඇති  තොරතුරු කියවීම හෝ තේරුම්ගැනීම අපහසුනම්

ඔබට භාෂාමය උදව් අවශ්‍ය නම් කරුණාකර අපට කියන්න. ඔබට ලබාදෙන සේවා සහ තොරතුරු අවබෝධකරගැනීම වැදගත් වේ. ඔබට වෛද්‍ය හමුවීමකට පැමිණිය නොහැකි නම් , හැකි ඉක්මනින් අපට දැන්වීම වැදගත්ය - භාෂණ පරිවර්තකයා අවලංගු කිරීම  එසේ නැතහොත් ඊළඟ දිනයට භාෂණ පරිවර්තකයකු ගෙන්වා ගැනීමට කටයුතු කිරීම අපට අවශ්‍යවනු ඇත.

භාෂණ පරිවර්තක සේවය ඔබට **නොමිළයේ ලැබේ.**

## නිවසේ සිට ඔබට අපව සම්බන්ධ කරගතහැක්කේ කෙසේද?

ඔබට ඉංග්‍රිසි භාෂාව පිළිබඳ යම්කිසි ගැටලුවක් ඇත්නම් එමෙන්ම අපව ඇමතීම අවශ්‍ය නම් - 131450  භාෂණ පරිවර්තක දුරකතන සේවය ට කතාකරන්න. මුලින්ම කෙනෙක් දුරකතනය මගින් ඉංග්‍රිසියෙන් කතාකරනු ඇත. මීලඟට පහත දැක්වෙන පියවරවල් අනුගමනය කරන්න.

1) ඔබ කතා කරන භාෂාව නම්කර දුරකතනයේ රැඳීසිටින්න. ඔබේ භාෂාව කතාකරන භාෂණපරිවර්තකයෙකුට ඔබව සම්බන්ධ කරනු ඇත.
2) ඔබට කතාකිරීමට අවශ්‍ය දුරකතන අංකය ලබාදෙන්න.
3) ඔබ දන්නේ නම්, ඔබට කතාකිරීමට අවශ්‍ය පුද්ගලයාගේ නම ලබාදෙන්න.
4) සම්බන්ධවනතුරු දුරකතනයේ රැඳීසිටින්න භාෂණ පරිවර්තකයා ඔබට උදව්වේවි. භාෂණ පරිවර්තක සේවය ඔබට **නොමිළයේ ලැබේ.**

## ඔබ හා සම්බනධීකරණය වීමේදී පවුලේ සාමාජිකයිනට වඩා වෘත්තීය භාෂණ පරිවර්තකයින් යොදාගැනීම අපට අවශ්‍යවනුයේ ඇයි

- අපට ඔබේ කැමැත්ත  ප්‍රකාශකරන විට එය අවශ්‍යය.
  - ඔබට අවශ්‍යවියහැකි කුමන ක්‍රියාදාමයන් සඳහා
  - ඔබට සපයන සේවා බාරගැනීමේදී
  - ඔබගේ පෞද්ගලික තොරතුරු වෘත්තීකයනට යැවීමේදී/ ඔබව යොමුකිරීමට සිදුවියහැකි සේවා සඳහා
- තොරතුරු වැරදි ලෙස පරිවර්තනය කිරීමක් හෝ වැරදි ලෙස අවබෝධකරගැනීමක් නිසා ඔබ කිසිම අවදානමකට පාත්‍ර නොවන බවට එය සහතිකවේ.
- එය  ඔබගේ අවශ්‍යතා සහ ප්‍රශ්න අප සමග පෞද්ගලිකවත් විශ්වාසී වත් සාකච්ජා කිරීමට ඔබට ඇති අයිතිවාසිකම් ආරක්ෂාකරයි.
- පවුලේ සාමාජිකයිනට නුහුරු වචන සමහරවිට අප භාවිත කිරීමට පුළුවන.

මේ ක්‍රමය ගැන ඔබ කැමති නම් ඒ එක්කම පවුලේ සාමාජිකයින් සිටීමට පුළුවන.නමුත් ඔබ සමහර අවස්ථාවල සංවේදී කරුණු පෞද්ගලිකව සාකච්ජා කිරීමට වඩා කැමතිවිය හැකිය.

භාෂණපරිවර්තක සේවය ඔබට **නොමිළයේ ලැබෙනු ඇත.**